# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.27 පැය 0915 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/852/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වෙමින් පවතින, පුද්ගලයෙකුට පිරිසක් විසින් පහර දීමේ වීඩියෝවකට අදාලව සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කිරිබත්ගොඩ පොලිස් ස්ථානය.**

සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වෙමින් පවතින, මහා මාගර්යේදී පුද්ගලයෙකුට පිරිසක් විසින් අතින් පයින් හා ආරක්ෂක හිස් වැසුමකින් පහර දෙන වීඩියෝවක් සම්බන්ධයෙන් කිරිබත්ගොඩ පොලිස් ස්ථානය මගින් විමශර්නයක් ආරම්භ කර ඇත.

ඒ අනුව, මෙම සිද්ධිය 2025.04.26 වන දින කිරිබත්ගොඩ පොලිස් වසමේ නුවර පාර මහජන බැංකුව ඉදිරිපිට දී සිදුව ඇත. පහර කෑමට ලක්වූ පුද්ගලයා පුද්ගලික ආයතනයක හිමිකරු ලෙස සේවය කරන බවත් එම ආයතනයේම සේවය කරනු ලබන තරුණියක් සමඟ ආයතනයේ කටයුත්තක් සඳහා හිමිකරු කඩවත ප්‍රදේශයට කාර් රථයකින් ගමන් කිරීමෙන් පසු තරුණියගේ පෙම්වතා බවට සඳහන් පුද්ගලයෙකු ආයතන හිමිකරු සමඟ බහින්බස් වීමක් සිදුව ඇත. එය දුරදිග යාමෙන් ඇති වූ විරසකය මත එම අය විසින් ඔහුගේ මිතුරෙකු සමඟ පැමිණ ඉහත ස්ථානයේදී පුද්ගලික ආයතනයේ හිමිකරුට මෙම පහරදීම සිදුකර ඇති බවත් දැනට සිදුකරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත. වැඩිදුර විමශර්නයෙන් පසු තරුණියගේ පෙම්වතා බවට සඳහන් කරන ලද පහරදීමට සම්බන්ධ සැකකරුවෙකු හා තවත් සැකකරුවෙකු කිරිබත්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් වයස අවුරුදු 22 හා 24 යන වයස්වල පසුවන මාකොළ හා කැළණිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

කිරිබත්ගොඩ පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**